**ශීර්ෂය 161 - තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

**-------------------------------------------------------------------------------------------------------------**

ශීර්ෂය 161 - තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 18 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී . ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**---------**

**2.1 විසර්ජන ගිණුම**

**-------------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

**--------------------------**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 274.54 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 223.42 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 51.12 ක් හෙවත් සියයට 18.62 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 174.36 | 166.31 | 8.05 | 4.62 |
| මූලධන | 100.18 | 57.11 | 43.07 | 42.99 |
| එකතුව | 274.54 | 223.42 | 51.12 | 18.62 |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 16101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 5.00 | 3.80 | 2.00 | 3.10 | 25.00 | 8.87 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ 7002/0000/00/418/0016/000 අංක දරන අග්‍රිම ගිණුමෙහි 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 6.54ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 27.667 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0013/0104/000 | 27.554 |
| 6000/0000/00/0016/0097/000 | 0.059 |
| 6000/0000/00/0018/0100/000 | 0.054 |
| **එකතුව** | 27.667 |

**2.5 විගණන නිරීක්ෂණය**

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3 .1 විසර්ජන ගිණුම

#### 3.1.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 55 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) අමාත්‍යවරයාට නිල වාහනයක් මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හා ප්‍රසම්පාදන කොමිෂන් සභාවට යොමු කිරීම මඟින් ඇතිවූ ප්‍රමාදය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යවරයාට නිල වාහනයක් මිළදී ගැනීමට නොහැකිවීම මත ඉහත සඳහන් මූලධන වියදම් ඉතිරිවීම් වලින් සියයට 35 ක් ඉතිරිවී තිබුණි.

### 3.2 අග්‍රිම ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාව අනුව 2016 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ නොපියවූ උප අග්‍රිමය රු.29,000 ක් විය.

(ආ) අපේක්ෂිත වියදම වඩාත් නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් නිලධාරීන් 03 දෙනකු සඳහා රු.92,850 ක අතිරික්ත මුදල් ප්‍රමාණයක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණි.

### 3.3 පොදු තැන්පත් ගිණුම

පොදු තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.25,507,736 ක්වූ තැන්පතු තිබුණි. ඉන් රු. 25,000,000 ක් ඉදිකිරීමේ කටයුත්තක් වෙනුවෙන් රාජ්‍ය සංස්ථාවකට ගෙවියයුතු මුදලක් වුවත් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අක්මුදල් නිදහස් නොකිරීම නිසා නොපියවූ ශේෂයක් ලෙස ඉදිරියට ගෙනැවිත් තිබුණි. ඉතිරි රු.507,736 ක මුදල සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂය රු. 414,275 ක්ව පැවතුනි. එයින් වර්ෂයක් ඉක්මවා නිරවුල් නොවී පැවති රු. 295,691 ක ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.5 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------

අමාත්‍යාංශය සතු මෝටර් වාහනයක් වර්ෂ 02 ½ කට අධික කාලයක් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවතුනි. 2016 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය සතු වෙනත් වත්කම් 26ක් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයේ පැවතුණි.

(ආ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-------------------------------------

ක්‍රීඩා අමාත්‍යාංශය හා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණු අමාත්‍යාංශය සතු මෝටර් වාහන 05 ක් 2017 ජූනි 30 දින වන විටත් අමාත්‍යාංශය වෙත ආපසු ලබා දී නොතිබුණි.

(ඇ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

----------------------------------------------------

වෙනත් ආයතන සතුව තිබුණු මෝටර් වාහන විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| **වත්කම අයත්ව තිබුණු ආයතනය** | **සංඛ්‍යාව** | **කාල පරිච්ඡේදය** |
|---|---|---|
| ගැමිදිරිය පදනම | 01 | දක්වා නොමැත. |
| සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය | 01 | |
| පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 01 | |
| රාජ්‍ය පරිපාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය | 02 | |
| වනජීවී සම්පත් සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 01 | |
| ව්‍යවස්ථා කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | 01 | |
| | 07 | |

(ඇ) **පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

----------------------------------------------------

උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය සහ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය සතු වාහන 08ක් නව අමාත්‍යාංශය විසින් 2017 ජූනි 30 දින වන විටත් විධිමත් පරිදි පවරා ගෙන නොතිබුණි.

(ඉ) **බේරුම් නොකළ බැරකම්**

------------------------

(i) අමාත්‍යාංශය විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 01 ට අඩු බැරකම් රු. 1,090,208 ක් විය.

(ii) මුදල් රෙගුලාසි 94 (1) ට පටහැනිව වැය විෂයයන් 08 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු. 578,620 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාලයේ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛයේ විධිවිධාන නොසළකා, අමාත්‍යවරයා හා කාර්ය මණ්ඩලය හිමිකම් ලබන උපරිම නිලවාහන සංඛ්‍යාව අනුයුක්ත කර තිබියදී සංචිත වාහනයක් අමාත්‍යවරයාගේ හා අමාත්‍ය කාර්යාලයේ රාජකාරි සඳහා යොදවා තිබුණි

## 3.7 කාර්යසාධනය

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

අමාත්‍යාංශය 2016 වර්ෂයේ ඇස්තමේන්තුවේ සඳහන් සිය ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය පිලියෙළ කරන බවට සහතික වීම හා තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා උපායමාර්ග සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා නෛතික රාමුවක් සැකසීම සඳහා වූ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත 2017 ජුනි 30 දින දක්වාත් සම්මත කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) 2016 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර තිබුණු නමුත් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් එහි ඇතුළත්ව නොතිබුණි. එසේ වුවත්, පවත්වන ලද තිරසර සංවර්ධන වැඩමුළු, රැස්වීම් හා විදේශ වැඩමුළු වෙනුවෙන් සහභාගී වූ නිලධාරීන් සම්බන්ධයෙන් 2016 වර්ෂය තුළදී රු.13,660,540 ක මුදලක් වියදම් කර තිබුණි.

(iii) මධ්‍යම පළාත හැර අනෙකුත් පළාත් හෝ ප්‍රාදේශීය මට්ටමින් තිරසර සංවර්ධන අරමුණු හෝ ඉලක්කයන් ඉටුකර ගැනීම සඳහා 2016 වර්ෂය තුළ ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.8** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**(අ)** **අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**---------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 13 | 8 |
| (ii) | තෘතියික මට්ටම | 3 | 3 | - |
| (iii) | ද්විතියික මට්ටම | 53 | 39 | 14 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 32 | 26 | 6 |
| | **එකතුව** | **109** | **81** | **28** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 28 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණු අතර ඉන් තිරසර සංවර්ධන අංශය සඳහා 12 ක් වූ අනුමත සමස්ත කාර්යය මණ්ඩලයම පුරප්පාඩු වී තිබුණි.